

සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.11



**සැකසුම: පුබුදි බාලසූරිය**
**ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය**

නිපුනතාවය - ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායන් ප්‍රකට කරයි.

නිපුනතා මට්ටම - චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි

පාඩම - සංස්කෘත නාට්‍ය රංග ශෛලියේ භාෂණ විධි

කාලච්ඡේද - 01 (විනාඩි 40)

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01). නළුවන් දෙනෙකු හෝ ඊට වැඩි ගණක් හෝ එක විට එකම හඬකින් දෙබස පැවසීම.
1. ඒකල භාෂණයයි 2. ප්‍රකාශන භාෂණයයි 3. ආත්මගත භාෂණයයි
4. ජනාන්තික භාෂණයයි 5. සාමූහික භාෂණයයි

(02). (සුසුම්ලා) අනේ අප්පේ, දඩයමට කැදර රජ්ජුරුවෝ එක්කලා තියෙන යාළුකම හින්දා මම දැන් හොඳටම හෙම්බත් වෙලයි ඉන්නේ '' ඉහත ප්‍රකාශය,
1. ස්වගත භාෂණයකි 2. ඒකල භාෂණයකි
3. රහස් කථනයකි 4. අපවාරිත භාෂණයකි
5. ප්‍රකාශ භාෂණයකි

(03). ආකාශ භාෂිතය වනුයේ,
1. චරිතයක් තමාගේ අභ්‍යන්තර හැඟිම් තමාටම කියා ගන්නා අයුරින් ප්‍රකාශ කිරීම.
2. ප්‍රේක්ෂකාගාරයට දෘශ්‍යමාන නොවන චරියක් හා සංවාදයේ යෙදෙන බව හඟවමින් පවසන දෙබස
3. රහසක් කීම.
4. චරිතයක් ප්‍රේක්ෂයන් දෙසට හැරී ඔවුන්ට යමක් පවසන ලෙස භාෂණයේ යෙදීම.
5. ප්‍රේක්ෂකාගාරයේ සියළු දෙනාටම ඇසෙන ලෙස ප්‍රකාශ කිරීම.

(04). ඒකල භාෂණයට අයත් නිවැරදි වරණය වන්නේ,
1. ත්‍රිපතාක නම් මුද්‍රාව භාවිතය
2. වේදිකාව තමන් යටතට ගෙන තමන් ඉදිරියේ ප්‍රේක්ෂක පිරිසක් සිටින බව දැන ඔවුන් අමතා කතාවක ස්වරූපය ගැනීම.
3. වේදිකාවෙන් ඉවත සිටින චරිතය පවසන දෙය අසන බව අභිනයෙන් ඇඟවීම.
4. රහසක් කීම.
5. චරිත කිහිපයක් වේදිකාවේ රැඳි සිටින විට එක් චරිතයත් තවත් චරිතයතට පමණක් ඇසෙන සේ කතා කිරීම.

(05). තාත්විකව රහස් කීම ඉදිරිපත් කිරීම හා දෙබස් හා චලන ලෝක ධර්මී ස්වරූපයෙන් ඉදිරිපත් කරනු ලබන භාෂණ විධි ද්විත්වය වන්නේ,
1. ප්‍රකාශ භාෂණය හා ජනාන්තික භාෂණය
2. රහස්‍ය කථනය හා අපවාරිත භාෂණය
3. ආත්මගත භාෂණය ස්වගත භාෂණය
4. රහස්‍ය කථනය හා ඒකල භාෂණය
5. ආකාශ භාෂිත හා රහස්‍ය කථනය

## II - කොටස

(01). i. සංස්කෘතික නාට්‍ය කලාවේ සංවාද හා රඟපෑම් මගින් ඉදිරිපත් කරන ලද ලිඛිත පිටපත් සහිත නාට්‍ය ප්‍රභේද ( රූපක ) 05 ක් නම් කරන්න.

ii. කෙටි සටහන් ලියන්න.
1. සාමූහික භාෂණ 2. ඒකල භාෂණ 3. ආකාශ භාෂිත

iii. කාලිදාසයන්ගේ ' අභිඥාන ශාකුන්තලය ' ඇසුරින් එහි සඳහන් භාෂණ විධි පිළිබඳ උදාහරණ සහිතව විමසන්න.



සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.12 - 2020.05.13



**සැකසුම: පුබුදි බාලසූරිය**
**ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය**

නිපුනතාවය - ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායන් ප්‍රකට කරයි

නිපුනතා මට්ටම - චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි

පාඩම - සංස්කෘත නාට්‍ය රංග ශෛලියේ හස්ත මුද්‍රා භාවිතය

කාලච්ඡේද - 02 (විනාඩි 80)

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01).



(1)



(2)

මෙහි දැක්වෙන්නේ හස්ත මුද්‍රා වන්නේ,
1. පතාක හා අරාල 2. ත්‍රිපතාක හා අර්ධ චන්ද්‍ර 3. චතුර හා ත්‍රිපතාක
4. පතාක හා ත්‍රිපතාක 5. අංජලී හා චතුර

(02). අර්ධ චන්ද්‍ර හස්ත මුද්‍රාව නිර්මාණය වන්නේ,
1. පතාක හස්තයේ වෙදගිල්ල ඉදිරියට නැවූ විටය.
2. පතාක හස්තයේ මාහපටඟිල්ල පසකට විදාලූ විටය.
3. පතාක හස්තය උඩු අතට හරවා දබරැඟිල්ල කෙලින් ඔසවා සිටි විටය.
4. පතාක හස්ත ද්වයය එකිනෙකට ඇලෙන සේ එක්කල විටය.
5. පතාක හස්ත ද්වයය මදක් බොකුටු ගැසෙන සේ එක් කල විටය.

(03). යමකු කැඳවීම, ස්ථිර සාර බව, සුවඳක් ආඝ්‍රණය කිරීම, නිරූපණය කිරීමට යොදා ගනු ලබන්නේ,
1. සර්ප ශීර්ෂ 2. අරාල 3. මුෂ්ටි 4. කපෝත 5. අංජලී

(04). අපවාරිත හා ජනාන්තික භාෂණවල යොදා ගනු ලබන්නේ,
1. ත්‍රිපතාක මුද්‍රාවය 2. පතාක මුද්‍රාවය 3. සර්ප ශීර්ෂ මුද්‍රාවය
4. සන්දංශ මුද්‍රාවය 5. පද්මකෝෂ මුද්‍රාවය

(05). හංසාස්‍ය හස්තය නිර්මාණය වන්නේ,
1. මහපට ඇඟිල්ල, දබරඟිල්ල හා මැදඟිල්ල එක්කොට සෙසු ඇඟිලි විසිරුවා හල විටය.
2. අතමිට මොලවා ගත් විටය.
3. සියළු ඇඟිලි තුඩු එක් කල විටය.
4. පතාක හස්තයේ ඇඟිලි හතර ඉදිරියට නැමූ කලය.
5. මහපට ඇඟිල්ල ඍජුව තබා සෙසු ඇඟිලි එයට යාකල විටය.

## II - කොටස

(01). i. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ භාවිත හස්ත මුද්‍රා විධි 04 හඳුන්වා දෙන්න.
ii. ඉහත සඳහන් හස්ත මුද්‍රා විධි දෙකක් අභිඥාන ශාකුන්තලය ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
iii. සංස්කෘත නාට්‍යයේ භාෂණ විධිවල දක්නට ලැබෙන ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ලක්ෂණ විමසන්න.



සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.14 /15



සැකසුම : ආර්.එම්. වසීතා රත්නායක,
ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල.

නිපුණතාවය : නාට්‍ය හා රංග කලාව විෂය හා බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජික පසුබිම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම : ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවේ පසුබිම හා විකාශය විමසයි

කාලච්ඡේද - 02 (විනාඩි 80)

1. ඉංග්‍රීසි නාට්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ
   i වික්ටෝරියා මහ රැජිනගේ රාජ්‍ය කාලයයි
   ii. vi වැනි ජෝර්ජ් මහරජුගේ රාජ්‍ය කාලය යි
   iii ii වැනි එළිසබෙත් මහ රැජිනගේ රාජ රාජ්‍ය සමයයි
   iv viii වැනි හෙන්රි රජුගේ රාජ්‍ය සමය යි
   v i වැනි එලිසබෙත් මහ රැජනගේ රාජ්‍ය කාලයයි

2. ඉංග්‍රීසි නාට්‍ය නාට්‍යයේ ස්වර්ණමය යුගයට අයත් නාට්‍යකරුවන් වනුයේ
   i. ජොන් ගැල්ස්වර්දි, ෂෙරිඩන් හා වෝසර් ය.
   ii. සමර්සෙට් මෝහම්, බර්නාඩ් ෂෝ හා බෙන් ජොන්සන් ය.
   iii. තෝමස් කයිඩ්, ක්‍රිස්ටෝෆර් මාර්ලෝ හා විලියම් ශේක්ස්පියර්.
   iv. විලියම් ශේක්ස්පියර්, හැරල්ඩ් පින්ටර් හා ඔස්කාර් වයිල්ඩ් ය.
   v. විලියම් ශේක්ස්පියර්, සැමුවෙල් බෙකට් හා බර්නාඩ් ෂෝ

3. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය නාට්‍ය කලාවක් ගොඩ නැගීමේදී පුරෝගාමී වූ නාට්‍යකරුවන් වන්නේ ,
   i. නිකොලායි ගොගොල්
   ii. විලියම් ශේක්ස්පියර්
   iii. E F C ලුඩොවයික්
   iv. ජෝර්ජ් බර්නාඩ් ෂෝ
   v ක්වින් ටෙරෝ සහෝදරයෝ

4. 1939 දී සිංහල වංශ කථා පදනම් කරමින් නිර්මාණය වූ ඉංග්‍රීසි නාට්‍යයක් වනුයේ ,
   I. ශ්‍රී නිශ්ශංකගේ Our Lanka
   ii. ගාමිණී ගුණවර්ධන ගේ Rama and sita
   iii. ලූෂන් සොයිසාගේ Fortress in the sky
   iv. V ආරියරත්නම් ගේ The Sigiriya King
   v. රෙජි සිරිවර්ධන ගේ The Almsgiving

5. ඉංග්‍රීසි නාට්‍ය කලාව තුළ විචාරාත්මක නාට්‍ය බිහි කිරීමේ පුරෝගාමියා වන්නේ ,
i. ලුයිජි පිරැන්ඩෙලෝ ය.
ii. අර්නස්ට් මැතින්ටයර් ය.
iii. පෙරන්ස් මෝල්නර්ගේ ය.
iv. නිකොලායි ගොගොල් ය .
v. ඉයුජින් ඔනිල් ය.

2කොටස

i. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාව ව්‍යාප්ත කිරීමෙහිලා පුරෝගාමී වූ නාට්‍ය කරුවන් 4ක් නම් කරන්න
ii. ඔබ නම් කරන ලද නාට්‍ය කරුවෙකු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න
iii. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාවෙ ඉතිහාසය හා විකාශය පිළිබඳ විස්තරයක් කරන්න